56

# සිංහල කෝළම් සම්ප්‍රදායේ අභිචාර ලක්‍ෂණ

*සී. එන්. ධර්මප්‍රිය [1]*
HU/2012/2270

සිංහල කෝළම් සම්ප්‍රදායේ ඇති අභිචාර ලක්‍ෂණ විග්‍රහ කිරිම මෙම පරික්‍ෂණ පත්‍රිකාවේ මුලික අරමුණ වේ. හුදෙක් විනෝදාස්වාදය මෙන්ම ශාන්ති කර්ම භූමිකාද, කෝළම් සඳහා යොදා ගෙන ඇත. මෙම සම්ප්‍රදාය විනෝදාස්වාදය මෙන්ම පූජාර්ථය ද මුලික පරමාර්ථයට හානියක් නොවන ආකාරයෙන් විද්‍යාමාන කෙරෙන බැවින් ඒවායෙහි තුළින් අභිචාරවත් ලක්‍ෂණ ඇතැයි පිළිගත හැකිය. සිංහල ජනතාව අතර ප්‍රචලිතව පැවති සියලුම ශාන්තිකර්ම් මානසික චිකිත්සාවන් ලෙසින් අගය කළ හැකි අතර කෝලම් ද එවැනි චිකිත්සක ක්‍රමයක් ලෙසින් භාවිත වුයේ දැයි සලකා බැලීම වටින්නේය. කෝලම් රංගනයට ඇතුළත් කර ඇති යක්‍ෂ භූමිකා පිළිබඳව ද අවධානය යොමු කිරිම වැදගත් වේ. එකී අභිචාරාත්මක ලක්‍ෂණ පිළිබඳ කෝලම් පද්‍ය ආශ්‍රයෙන් තොරතුරු ලබා ගත හැකිය (පූර්ණක යක්‍ෂයා පිළිබඳ කෝලම් රංගනයට ඇතුළත් කිරිමේදි රෝපණය කළ දෝෂ ඇත්තෝ අප රැක දී සෙත් දෙන්නේ...... යනුවෙන් සඳහන් කිරිමෙන් යම් ගුප්තාර්ථයක් මෙහි ගැබ්ව ඇතැයි සිතු ආකාරය පැහැදිලි වේ). නාගරාක්‍ෂ චරිතය ඉදිරිපත් කිරිමේදි ඒ මගින් සබයට මෙන්ම කපු ඇදූරාට ද සෙත් දෙන මෙන් ආයාචනා කරයි. කපු ඇදූරා යන්න යොදන්නේ හුදෙක් ශාන්තිකර්මවලදි විනා අනෙකුත් ගැමිනාටකවලදි නොවේ. මෙහිදී කපු ඇදූරා ලෙසින් නාට්‍යයේ නියමුවා හඳුන්වා ඇත්තේ ශාන්තිකර්ම අර්ථයක් අන්තර්ගතව තිබු බැවිනි. එසේම කෝළම් නමින් ගර්භ ශාන්තියක් දක්ෂිණ භාරතයේ පවත්නා බවත් එම ශාන්තිකර්මය ගර්භයට මාස 07ක් සම්පූර්ණ වු අවස්ථාවේදි සිදු කෙරෙන බවත් සාහිත්‍යමය තොරතුරුවලින් හෙළිදරව් කරගැනීමට හැකි විය. මෙම සාධක පසුබිම් කර ගනිමින් දැනට ලියවී ඇති මුලාශ්‍ර සාධක මෙන්ම ක්‍ෂේත්‍ර ගවේෂණය මගින් ද ලබා ගන්නා දත්තද ඉහත අරමුණ විශ්ලේෂණ කිරිම සඳහා උපයෝගි කර ගැනීමට අපේක්ෂිත ය.

ප්‍රමුඛ පද : කෝළම්, අභිචාර ලක්‍ෂණ, පූජාර්ථය, ශාන්තිකර්ම, මානසික චිකිත්සාව

*1 ප්‍රාසංගික කලා ශාස්ත්‍රවේදී (විශේෂ) දෙවන වසර*